# අර්ථ සාධක අරමුදල - " බී "

# රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ - "බී" අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**1.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

2012 වර්ෂයේදී ලැබී තිබුණු 2010 වර්ෂය සඳහා ආයෝජන ආදායම රු.21,730 ක් සමාලෝචිත වර්ෂය සඳහා සාවද්‍ය ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ආයෝජන ආදායම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

**1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | අනුකූල නොවීම |
|---|---|
| 1979 ජුනි 01 සිකුරාදා දිනැති අංක 38/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය 04 රීතිය | සාමාජිකයන්ගේ බැරට පවත්නා සියළුම මුදල් ඕනෑම රජයේ බැංකු ණයකරවල හෝ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතු වුවත්, සියළුම අරමුදල් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර |

තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය සාමාජිකයින්ගේ ගිණුම්වලට බැර කරන ලද රු.2,299,550 ක පොලියක්වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර කරන ලද පොලිය රු.1,813,064 ක් වුයෙන් රු.486,486 කින් එනම්, සියයට 26.83 කින් මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමක් දැක්වුණි. මෙම ධනාත්මක උපනතියට ප්‍රධාන වශයෙන් හේතු වුයේ සමාලෝචිත වර්ෂය තුළ පොලී අනුපාතිකය වැඩිවීමයි.

(ආ) ලබාගත හැකිවු තොරතුරු අනුව, ඉකුත් වර්ෂ 3 තුළ හා සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය පහත දැක්වේ.

| | | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| (i). | ස්ථාවර තැන්පතු හා ඉතිරි කිරීම් ගිණුම් මත පොලී ආදායම | 1,280,552 | 1,675,320 | 1,976,387 | 2,417,405 |
| (ii). | සාමාජිකයන්ට දෙන ලද ණය මත පොලී ආදායම | 110,860 | 67,197 | 89,225 | 73,230 |
| | | ----------- | ----------- | ---------- | ----------- |
| (iii). | උත්පාදනය කරන ලද මුළු පොලී ආදායම | 1,391,412 | 1,742,517 | 2,065,612 | 2,490,635 |
| (iv). | බදු වියදම් | (187,232) | (181,306) | (212,149) | (284,719) |
| | | ----------- | ----------- | ---------- | ----------- |
| (v). | ශුද්ධ පොලී ආදායම් | 1,204,180 | 1,561,211 | 1,853,463 | 2,205,916 |
| (vi). | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් කරන ලද අතිරේක දායකය | 1,095,370 | 251,853 | 268,028 | 626,569 |
| (vii). | සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර කරන ලද මුළු පොලිය | 2,299,550 | 1,813,064 | 2,121,491 | 2,832,485 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 සිට 2012 කාලපරිච්ඡේදය තුළදී ස්ථාවර තැන්පතු හා ඉතිරි කිරීම් ගිණුම්මත පොලී ආදායම රු.2,417,405 සිට රු.1,280,552 දක්වා එනම්, සියයට 47.02 කින් අඩුවී තිබුණි.

(ආ) 2009 සිට 2012 කාල පරිච්ඡේදය තුළදී, සාමාජිකයන්ට දෙන ලද ණය මත පොලී ආදායම රු.73,230 සිට රු.110,860 දක්වා එනම්, සියයට 51.38 කින් වැඩිවී තිබුණි.

(ඇ) 2009 සිට 2012 කාල පරිච්ඡේදය තුළදී අතිරේක දායකය රු.626,569 සිට රු.1,095,370 දක්වා එනම්, සියයට 74.82 කින් වැඩිවී තිබුණු අතර, සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර කරන ලද මුළු පොලිය රු.2,832,485 සිට රු.2,299,550 දක්වා එනම් සියයට 18.81 කින් සැලකිය යුතු ලෙස අඩුවී තිබුණි.

## 2.2 හඳුනාගන්නා ලද පාඩු

(අ) අරමුදලේ අවශ්‍යතා සැලකීමෙන් තොරව ආයෝජන සිදුකිරීම හේතුවෙන් කල්පිරීම් දිනයට පෙර ආපසු ගැනීමට සිදුවී තිබුණි. ඒ අනුව අරමුදල රු.142,865 ක පාඩු දරා තිබුණි. විස්තර පහත දැක්වේ.

| ස්ථාවර තැන්පතු අංකය | කාලපරිච්ඡේදය | 2011 පොලී අනුපාතය | මුදල | ආපසු ගත් දිනය | 2012 පොලී අනුපාතය | මුදල |
|---|---|---|---|---|---|---|
| | | (%) | රු. | | % | රු. |
| F/001/000096 | 2011.08.13 - 2012.08.13 | 10 | 517,591.70 | 2012.08.09 | 8.5 | 43,995.29 |
| 001/25/31409 | 2011.11.23 - 2012.11.24 | 8.5 | 484,647.81 | 2012.10.08 | 5.5 | 26,655.63 |
| 1/25/53057 | 2011.12.30 - 2012.12.31 | 9 | 347,835.11 | 2012.11.12 | 8.63 | 30,018.17 |
| F/001/04/0012656 | 2011.09.07 - 2012.09.07 | 8.5 | 767,198.99 | 2012.08.09 | 5.5 | 42,195.94 |
| | | | | | | 142,865.03 |

(ආ) කල් පිරීම් දිනය හා ආපසු ගත් දිනය අතර කාලය සඳහා පොලී ලැබී නොතිබුණි. එබැවින් අරමුදල රු.99,207 ක ඇස්තමේන්තුගත පාඩුවක් දරා තිබුණි. විස්තර පහත දැක්වේ.

| ස්ථාවර තැන්පතු අංකය | කල්පිරීම් දිනය | ආපසුගත් දිනය | අතිරික්ත දින (පොලී නොමැතිව) | පොලී නොලැබී පාඩුව |
|---|---|---|---|---|
| | | | - | රු. |
| F/001/25/0020811 | 2012-11-12 | 2012-12-06 | 25 | 18,409 |
| 0-01/25/0020572 | 2012-12-06 | 2012-12-06 | 54 | 26,060 |
| 1/25/0028918 | 2012-11-09 | 2012-12-06 | 27 | 3,640 |
| 1/25/0031011 | 2012-10-21 | 2012-11-12 | 22 | 3,129 |
| 001/25/0051824 | 2012-09-30 | 2012-10-08 | 09 | 2,572 |
| 1/25/55337 | 2013-09-28 | 2012-11-12 | 46 | 37,093 |
| F/001/04/0025136 | 2012-10-09 | 2012-11-12 | 35 | 4,095 |
| F/001/04/0041355 | 2012-07-24 | 2012-08-09 | 17 | 4,209 |
| | | එකතුව | | 99,207 |

## 2.3 සාමාජිකයන්ට ලබාදුන් ණය

විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ හා ඉකුත් වර්ෂය තුළ සාමාජිකයන්ට ලබාදෙන ලද ණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|
| | 2012 | 2011 |
| | රු. | රු. |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 892,467 | 1,534,010 |
| එකතු කළා : | | |
| ----------- | | |
| වර්ෂය තුළ සාමාජිකයන්ට ලබාදුන් ණය | 350,000 | 120,000 |
| | ----------- | ---------- |
| | 1,242,467 | 1,654,010 |
| අඩුකළා :- | | |
| ---------- | | |
| වර්ෂය තුළ අයකර ගැනීම් | (1,235,193) | (761,543) |
| | -------------- | ------------ |
| ඉදිරියට ගෙනගිය ශේෂය | 7,274 | 892,467 |

2011 වර්ෂය සමඟ සැසඳීමේදී 2012 වර්ෂයේ සාමාජිකයන්ට ලබාදුන් ණය රු.230,000 කින් එනම්, සියයට 191.6 කින් වැඩිවී තිබුණු අතර, 2011 වර්ෂය සමඟ සැසඳීමේදී 2012 වර්ෂය තුළදී අයකර ගැනීම් රු.473,650 කින් එනම්, සියයට 62.20 කින් වැඩිවී තිබුණි.

## 2.4 සාමාජික දායකත්වය

විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ සාමාජික දායකත්වය, බැංකු දායකත්වය හා සාමාජික ගිණුම්වලට බැර කරන ලද පොලී පහත දැක්වේ.

| | 2012 | | | | 2011 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **සාමාජික දායකත්වය** | **බැංකුවේ දායකත්වය** | **බැර කරන ලද පොලී** | **එකතුව** | **සාමාජික දායකත්වය** | **බැංකුවේ දායකත්වය** | **බැර කරන ලද පොලී** | **එකතුව** |
| | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 3,325,548 | 4,981,852 | 12,151,352 | 20,458,752 | 3,811,759 | 5,709,077 | 12,871,285 | 22,392,121 |
| <u>එකතු කළා :-</u> | | | | | | | | |
| වර්ෂය තුළ දායකත්වය | 231,543 | 347,313 | 2,271,478 | 2,850,334 | 292,647 | 438,971 | 1,813,064 | 2,544,681 |
| එකතුව | 3,557,091 | 5,329,165 | 14,422,830 | 23,309,086 | 4,104,406 | 6,148,048 | 14,684,349 | 24,936,802 |
| <u>අඩුකළා :-</u> | | | | | | | | |
| වර්ෂය තුළ ගෙවීම් | 2,560,382 | 3,834,276 | 10,198,110 | 16,592,768 | 778,857 | 1,166,196 | 2,532,997 | 4,478,050 |
| ඉදිරියට ගෙනයන ලද ශේෂය | 996,709 | 1,494,889 | 4,224,720 | 6,716,318 | 3,325,549 | 4,981,852 | 12,151,352 | 20,458,752 |

2011 වර්ෂය සමග සැසඳීමේදී 2012 වර්ෂයේ අරමුදලට මුළු දායකය රු.305,653 කින් එනම්, සියයට 12.01 කින් වැඩිවී තිබුණු අතර, 2011 හා සැසඳීමේදී රු.16,592,768 ක මුදලක් 2012 වර්ෂයේ සාමාජිකයන්ට ගෙවා තිබුණි.